din-01-12-uns-751P-22x4-pnf-3

# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## කොන්ත්‍රාත් අනන්‍යතා අංකය : TRC/ADM/01/24/04/33

## වසරක කාලසීමාවක් සඳහා (2026 - 2027) වායුසමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව, නඩත්තුව සහ සේවා කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) 276, ඇල්විටිගල මාවත, කොළඹ 08, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (සුළු පරිමාණ) සභාපති විසින් වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව, නඩත්තුව සහ සේවා කිරීම සඳහා ලංසු කැඳවනු ලැබේ.

**පහත සඳහන් මධ්‍යස්ථාන සඳහා සේවාවන් සැපයිය යුතුය.**

- **අ) ප්‍රධාන කාර්යාලය, 276, ඇල්විටිගල මාවත, කොළඹ 08.**
- **ආ) සංඛ්‍යාත නිරීක්ෂණ මධ්‍යස්ථානය, කදිරාන.**
- **ඇ) සංඛ්‍යාත නිරීක්ෂණ මධ්‍යස්ථානය, හන්තාන.**
- **ඈ) බහුකාර්ය රූපවාහිනී සහ විදුලි සංදේශ කුලුන, කොකාවිල්.**
- **ඉ) විදුලි සංදේශ කුලුන, මඩුකන්ද.**

නැවත නොගෙවන ටෙන්ඩර් ගාස්තුව රු. 2,000.00 ක් මුදලින් ගෙවීමෙන් අනතුරුව අධ්‍යක්ෂ (පරිපාලන හා ආයතනික කටයුතු) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් 2026.01.14 දින සිට 2026.01.23 දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා සුදුසුකම්ලත් සමාගම්වලට ලංසු ලිපිලේඛන ලබාගත හැක.

සියලුම ලංසු සමග, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවකින් ලබාගත් රුපියල් පහළොස් දහසක (ලං.රු. 15,000.00) ලංසු ඇපකරයක් ඉදිරිපත් කළයුතු අතර, එම ලංසු ඇපකරය ලංසු ලිපි ලේඛනයෙහි දක්වා ඇති ආකෘතියෙන් යුක්ත විය යුතුය.

මුද්‍රා තැබූ ලංසු බහා එවන කවරයෙහි ඉහළ වම් කෙළවරේ "වසරක කාලසීමාවක් සඳහා (2026 - 2027) වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව, නඩත්තු සහ සේවා කිරීම" යන්න සඳහන් කර 2026.01.26 දින ප.ව. 02.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (සුළු පරිමාණ), ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 ලිපිනය වෙත ගෙනවිත් භාරදිය යුතුය. නැතහොත් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පරිපාලන අංශයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි බහාලිය යුතුය. ලංසු භාරගැනීමේ කාලය අවසන් වූ වහාම ලංසුකරුවන්ගේ සහභාගීත්වයෙන් ලංසු විවෘත කරනු ලැබේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ හි පරිපාලන අංශයෙන් (දුරකථන : 0112669789) ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු ලබාගැනීම සහ ලංසු ලිපි ලේඛන පරීක්ෂාකොට බැලීම සිදුකළ හැක.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (සුළු පරිමාණ),**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL),**
**276, ඇල්විටිගල මාවත, කොළඹ 08.**
**2026.01.13**